# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# தேசிய வரவு செலவுத்திட்ட திணைக்களம்
# DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
பொதுத்திறைசேரி, நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு, கொழும்பு 01, இலங்கை
General Treasury, Ministry of Finance and Mass Media, Colombo 01, Sri Lanka

**Web Site:** www.treasury.gov.lk  e-mail: budget@nbd.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BD/CBP/4/1/2-2018 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி.<br>Date | 2017.11.07 |

ලේකම්

..................................

..................................

**<u>කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම</u>**

"වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ" යන මැයෙන් යුතු 2017 ජූලි 25 දිනැති අංක 2/2017 දරණ ජාතික අයවැය චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02. එකී චක්‍රලේඛයේ 3 සහ 4 ඡේදයන්හි අවධාරණය කොට ඇති පරිදි, පසුගිය වසර කිහිපය තුළදී යොදාගත් ශුන්‍ය පාදක අයවැයකරණ ක්‍රමවේදය වෙනුවට කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට රජය මගින් පියවර ගනිමින් සිටී. ශුන්‍ය පාදක අයවැයකරණ ක්‍රමවේදයේ සිට කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය දක්වා මාරුවීම මගින් මූල්‍යමය සහ මූල්‍යමය නොවන සම්පත් වෙන්කිරීමේදී සැළකිය යුතු වෙනස්කම් නිර්මාණය වේ. කෙසේ වුවද, ආයතනික කාර්යසාධනය, ශුන්‍ය පාදක අයවැයකරණයේදී වැදගත් කොටසක් ලෙස දැනටමත් හඳුනාගෙන ඇත. එමනිසා, කාර්යසාධනය මත පදනම් වූ අයවැයකරණ ක්‍රමවේදය හඳුන්වා දීම, ශුන්‍ය පාදක අයවැයකරණ ව්‍යාප්තියක් ලෙස සැළකිය හැකි අතර, සම්පත් වෙන්කිරීම සඳහා වන බලපරාසය, ප්‍රතිපත්ති ලේඛන හෝ ක්‍රමෝපායික ලේඛන මගින් ලබාගන්නා කාර්යසාධන තොරතුරු ලෙස දැනටමත් ලේඛනගත කොට ඇති කාර්යසාධනය තවදුරටත් භාවිතා කළහැක.

03. කාර්යසාධන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන විට අනාගතයේදී සෑම ආයතනයකම කාර්යසාධන සංස්කෘතියක් ඇති කිරීමට පියවර ගතයුතු බව සැළකිල්ලට ගතයුතුය. කෙසේ වුවද, කාර්යසාධනය මත පදනම් වූ කළමනාකරණය හඳුන්වා දීම ආරම්භයේදීම, යෙදවුම්, ක්‍රියාවලීන් සහ කාර්යයන් (inputs, processes & achieves) මත පදනම් වූ ලේඛනගත කිරීමේ සිට නිමැවුම් ප්‍රතිඵල හා බලපෑම් (outputs, outcomes and impacts)හි කාර්යසාධනය මත පදනම් වූ ලේඛනගත කිරීම වෙත මාරු වීම අවශ්‍ය වේ. මේ අතර, ගතයුතු ක්‍රියාමාර්ගයන්හි නිශ්චිත ප්‍රතිඵල සහ ඒවා ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය නියම වශයෙන් සඳහන් කිරීමේදී ඇතැම් ආයතනයන් හට දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුවන බව පැහැදිලිය. කෙසේ වුවද, ක්‍රියාවලියේ ආරම්භක පියවර ලෙස සෑම ආයතනයකටම තම නිමැවුම් පහසුවෙන් හඳුනා ගැනීම සහ ලේඛනගත කිරීම සිදුකළ හැකි බව පැහැදිලිවම පිළිගත් කරුණකි. දෙවන අදියරේදී සෑම ආයතනයක් මගින්ම ප්‍රතිඵල හා සබැඳි ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) ප්‍රකාශයට පත්කළ යුතු වේ. මූල්‍ය සම්පත් වෙන්කිරීම පිණිස 2018 වර්ෂය සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී ඇතැම් ආයතන මගින් ඒ ආකාරයෙන් නිමැවුම් / ප්‍රතිඵල ඇතුළත් ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබූ බව සඳහන් කළයුතු වේ.

එබැවින්, 2018 වර්ෂය සඳහා දැනටමත් වෙන්කර ඇති මූල්‍ය සම්පත් සඳහා වන නිමැවුම් සහ ඉලක්කයන් අදාළ ආයතන විසින් හඳුනාගත යුතුව ඇත.

04. ඒ අනුව, සියලුම ආයතන මගින් (අමාත්‍ය කාර්යාල හැර) පහත තොරතුරු 2017 දෙසැම්බර් මස 15 වන දින වන විට ඉදිරිපත් කළයුතුය. ආයතන ප්‍රධානීන් විසින් අත්සන් කරන ලද දෘඪ පිටපත් එවන අතරතුර ලේඛනයන්හි මෘදු පිටපත් අදාළ විෂය භාර නිලධාරීන් වෙත යොමුකරන ලෙස දන්වා සිටිනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| i. | මෙහෙවර | - | එකී ආයතන ක්‍රියාත්මක වන්නේ කුමක් සඳහා ද යන්න ඇතුළත්ව |
| ii. | ප්‍රධාන කාර්යයන් | - | අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් කර ඇති පරිදි ආයතනයන්හි ප්‍රධාන කර්තව්‍යයන් |
| iii. | අයවැය ඇස්තමේන්තුවේ නිමැවුම් | - | ආයතනයේ අපේක්ෂිත නිමැවුම්<br>අ. නිමැවුම් නාමය (හෝ ක්‍රියාකාරකම)<br>ආ. අවශ්‍ය ගුණාත්මකභාවය / තත්ත්වය සහ කාලසීමාව |
| iv. | හඳුනාගත හැකි නම් ආයතනයේ ප්‍රතිඵල සහ බලපෑම | | |

05. ඉහත කරුණු පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේනම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ අයවැය අධ්‍යක්ෂ ඇමතීමට කටයුතු කිරීමට කාරුණිකවන්න.

අත්.කළේ / කේ.ඩී.එස්.රුවන්චන්ද්‍ර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. සභාපති, ................................
6. අධ්‍යක්ෂ ජනරාල් / කළමනාකාර අධ්‍යක්ෂ